## නව තාක්ෂණය

# රෝග ආවේක්ෂණ නවීන උපකරණයක් ලංකාවට එයි




එම්. ආර්. අයි. ස්කෑනර් යන්ත්‍රය සවි කළ කුටිය තිරස්ව පෙනෙන ආකාරය

ශරීරයේ රෝග නිර්ණය කිරීමේ අලුත් ම උපකරණයක් නවලෝක රෝහල මගින් ලංකාවට ගෙන්වනු ලැබ ඇත. මැග්නෙටොම් සිම්පනි හෙවත් එම්. ආර්. අයි. ස්කෑනර් යනුවෙන් හැඳින්වෙන මේ උපකරණයෙන් ශරීරයේ හැම කොටසක ම චුම්බක අනුනාද ඡායාරූප ලබා ගත හැකි ය. එමගින් සිරුරේ හරස්, තිරස් හා ඇල ඡායාරූප ලබාගැනීමට පුළුවන. මේ සඳහා පරිගණකයක් ද උපකාර කර ගැනේ. මෙය භාවිතයට පහසු එසේම රෝගියාට කරදරයකින් තොරව පරීක්ෂණ වාර්තා ලබාගත හැකි උපකරණයකි.

ජර්මනියේ නිෂ්පාදිත මෙම එම්. ආර්. අයි. ස්කෑනර් යන්ත්‍රයේ වටිනාකම රුපියල් දස ලක්ෂ සියයකි. මේ උපකරණය ක්‍රියාත්මක කිරීමේදී බොහෝ අවස්ථාවලදී පරිගණක කාමරයක් අවැසි නොවේ.

මොළය පිළිබඳ රෝග, අස්ථි රෝග, ශ්වසන පද්ධති රෝග, ඇතුළු සිරුරේ විවිධ තැන්වල හටගන්නා රෝග රැසකට අදාළ වැදගත් තොරතුරු මෙමගින් ලබාගත හැකි ය.

කොඳු ඇට පේළිය සම්බන්ධ රෝග පරීක්ෂා කිරීමේ දී මීට පෙරදී සිදු කළ මයලෝ ග්‍රැම් පරීක්ෂණය දැන් අවශ්‍ය නොවන අතර එය සෘජුව ම චුම්බක ආධාරයෙන් නිර්ණය කළ හැකි ය. ටෙස්ලා 1.5 වර්ගයට අයත් මෙවැනි උපකරණයක් ශ්‍රී ලංකාවේ භාවිත වන්නේ ප්‍රථම වතාවට ය. මීට පෙරදී ටෙස්ලා 0.2 හා 1.0 වර්ගයට අයත් එම්. ආර්. අයි. ස්කෑනර් යන්ත්‍ර ශ්‍රී ලංකාවේ භාවිත කෙරිණි.

රෝගියා ගේ ලියාපදිංචියේ සිට ස්කෑන් කිරීම, ඡායාරූප සැකසීම ඇතුළුව රෝග නිර්ණයට අදාළ කටයුතු විශාල සංඛ්‍යාවක් මෙමගින් කළ හැකිය.

❑




එම්. ආර්. අයි. ස්කෑනර් යන්ත්‍රය මගින් රෝගියකු පරීක්ෂා කිරීමට සූදානම් වන අයුරු



එඑම්. ආර්. අයි. ස්කෑනර් යන්ත්‍රය සවිකළ කුටිය සිරස්ව දර්ශනය වන ආකාරය